# 15

# ලේඛකයකුගේ ළමාවිය





වර්තමාන ශ්‍රී ලංකාවේ බිහිවුණු උගතුන් අතර කුමාරණතුංග මුනිදාස මහතා විශේෂ පුද්ගලයෙකි. ඔහු ගුරුවරයෙක් ලෙස ජීවිතය ආරම්භ කළේ ය. ඔහු විවිධ මාදිලියේ පොතපත ලියමින් කවියකු, විචාරකයකු හා ගත්කතුවරයකු ලෙස ප්‍රසිද්ධ විය. 'ලක්මිණි පහන' නමින් පුවත් පතක් ද, 'සුබස' නමින් සඟරාවක් ද පළ කළ ඔහු පුවත්පත් කලාවේදියෙක් ද විය. ඔහුගේ විශිෂ්ටතම කාර්යය ලෙස සැලකෙන්නේ සිංහල ව්‍යාකරණයට ඔහු ලබා දුන් දායකත්වයයි. 1887 ජූලි මස 25 වන දා උපන් කුමාරණතුංග මහතා 1944 මාර්තු 02 වන දා මිය ගියේ ය.

ඒ දික්වැල්ලේ බෞද්ධ පාසලයි. පාසලේ වැඩ අවසන් වන සීනුව නාද වෙයි. ළමයි කඩිසර ලෙස පාසලින් පිට ව යති. යහළුවෝ එකට එක් වී විහිළු තහළු කරති; නොයෙකුත් තොරතුරු කතා කරති. පාරේ ගමන් කරන ඔවුහු විටෙක බෝක්කුවට එබෙති. විටෙක දිය පහරට එබී දියේ පිහිනන මාළුන්ගේ සුන්දරත්වය බලා සතුටු වෙති. මේ අය අතර කුඩා මුනිදාස ද වෙයි.

කුඩා මුනිදාස සියල්ලන් පසු කොට ඉදිරියට දිව යයි. පාර අයිනේ ගොඩගසා ඇති ගල් ගොඩක් මත හිඳ ගනියි. ගෙදර දී කළ යුතු වැඩ එතැන දී ම කරයි. මෙය දිනපතා ම සිදුවෙයි. ගෙදර දී ඔහු පාසල් වැඩ කළේ නැත. ගෙදර දී ඔහු දඟකාරයෙකි. දහතුන් දෙනකුගෙන් යුත් පවුලේ දොළොස් වැනියා වූයේ ඔහු ය. එබැවින් ඔහුට සියල්ලන්ගේ ආදර සැලකිලි නොඅඩු ව ලැබිණ.

දිනක් ළමයි පාසල ඇරී ගෙදර එමින් සිටියහ. ඔවුන්ට මහන්සිය ද බඩගින්න ද තදින් දැනුණේ ය. පාර අයිනේ ගෙවත්තක පැසුණු ගෙඩිවලින් අතු බර වුණු දොඩම් ගසක් තිබුණේ ය. ගෙවත්තේ වූ නිවසෙහි නිවැසියන් පෙනෙන්නට නැත.

"කෝ, කවුරුවත් පේන්න නැහැ නේ. ඒ හින්දා අපි ඉක්මනට දොඩම් කඩමු."



කවුරුත් ඊට කැමති වූහ.

ළමයි දෙතුන් දෙනෙක් ගසට නැග දොඩම් කැඩූහ. ඉන් පසු, ඔව්හු ඒවා සමසේ බෙදා ගත්හ.

පාසල ඇරී පුතා ගෙදර එන තුරු පියා බලා සිටියේ ය. මුනිදාස ගෙදර ආවේ තමන්ට ලැබුණු දොඩම් ගෙඩි කිහිපය ද ඇතැති ව ය.

"මොනවා ද ඔය අතේ?" පියා ඇසී ය.

"දොඩම්."

"දොඩම් කොහෙන් ද?"

"ළමයි මග දි දොඩම් කැඩුවා. මේ මගේ කොටස."

"අයිතිකාරයාගෙන් අහලා ද කැඩුවේ?"

"නැහැ අයිතිකාරයා හිටියේ නැහැ," මුනිදාස කීවේ ය. වත්තකට පැන දොඩම් කැඩීම ගැන පියා කෝපයට පත් විය. ඔහු පුතාට තරවටු කළේ ය. අයිතිකාරයාට නොකියා දොඩම් කැඩීම වරදක් බව ද පෙන්වා දුන්නේ ය. මුනිදාස එවෙලේ ම පියාගෙන් සමාව ඉල්ලුවේ ය. "මගෙන් සමාව අරන් මදි. දොඩම් ගහේ අයිතිකාරයාගෙන් සමාව ගන්නැ"යි පියා ඔහුට කීවේ ය.

මුනිදාස එසේ කළේ ය.

දඟකාරකම් කළත් මුනිදාස කුඩා අවදියේ සිට ම ඉගෙනීමෙහි දක්ෂයෙක් විය. මතක තබා ගැනීමේ ශක්තිය ඔහුට නොඅඩු ව තිබිණි. ඔහුගේ වැඩිමල් සොහොයුරෝ ගෙදර දී ද ගුරුවරයකුගෙන් ඉගෙන ගත්හ. ඔහු පසෙකට වී ඒ පාඩම්වලට ඇහුම්කන් දුන්නේ ය. සොහොයුරන්ටත් වඩා හොඳින් ඔහු ඒවායේ කරුණු වටහා ගත්තේ ය.

කුඩා මුනිදාස පසුව කුමාරණතුංග මුනිදාස නමින් ප්‍රසිද්ධ විය. ගුරුවරයකු වූ ඔහු පසු ව පාසල් පරීක්ෂකවරයෙක් ද වූයේ ය. ඔහු නොයෙක් පොතපත ලීවේ ය. කවි රචනා කළේ ය. කුඩා දරුවන් සඳහා ඔහු ලියූ කවි හා කතා ඉතා ජනප්‍රිය විය. 'කුමර ගී' 'මඟුල්කෑම' හා 'හීන්සැරය' ඔහු ළමයින් සඳහා ලියූ පොත්වලින් කිහිපයකි. කුමර ගී පොතේ එන දරු නැළවිල්ල අපූරු නිර්මාණයකි. මේ එහි එන එක් පැදියකි.

''හඳපානේ වැලි තලා සුර කුමරියො මල් සලා
නටති මෙ දෙස බලබලා ගිගිරි වළලු පයැ නොලා''



## ක්‍රියාකාරකම 01



i. මෙම පාඩම නිසි උච්චාරණයෙන් යුතු ව කියවන්න.
இப்பாடத்தை உரிய உச்சரிப்புடன் வாசிக்கவும்.

ii. ඔබට මුහුණපෑමට සිදු වූ රසවත් සිද්ධියක් හෝ අවස්ථාවක් හෝ පිළිබඳ තොරතුරු කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
உங்களுக்கு முகங்கொடுக்க நேர்ந்த சுவையான சம்பவம் அல்லது நிகழ்வு ஒன்று பற்றிய தகவல்களை சுருக்கமாக வகுப்பறையில் முன்வைக்கவும்

## ක්‍රියාකාරකම 02

පාසල් අවධියේ කුමාරණතුංග මුනිදාස මහතා සිදු කළ දඟකාරකමක් වන දොඩම් කැඩීමක් ගැන මේ පාඩමේ එයි. දොඩම් කඩන්නට ගිය මිතුරන් අතර ඇති වූ කතාබහ සංවාදයක් ලෙස නිර්මාණය කරන්න.

පළමු මිතුරා — මට හරි බඩගිනියි

දෙවන මිතුරා — මටත් බඩගිනියි

තුන්වන මිතුරා — අන්න දොඩම් ගහක්

පළමු මිතුරා ..........................................................................

දෙවන මිතුරා ..........................................................................

තුන්වන මිතුරා ..........................................................................

## ක්‍රියාකාරකම 03

ඔබ දන්නා වෙනත් ප්‍රසිද්ධ පුද්ගලයකුගේ ළමා කාලය පිළිබඳ රසවත් සිදුවීමක් පන්තියට විස්තර කරන්න.
நீங்கள் அறிந்த வேறு பிரபலமான ஒருவரது சிறுபராயம் தொடர்பான சுவையான சம்பவம் ஒன்றை வகுப்பறையில் விளக்கவும்.

## ක්‍රියාකාරකම 04

නාදන් හා මොහොමඩ් එක ම පන්තියේ ඉගෙන ගනිති. ඔවුහු හොඳ මිතුරෝ ය. දිනක් ඔවුන් දෙදෙනා එකතු වී කළ හොඳ වැඩක් ගැන කෙටි නිර්මාණයක් කරන්න.

நாதனும் மொஹமட் உம் ஒரே வகுப்பில் கல்வி கற்றனர். அவர்கள் நல்ல நண்பர்கள், ஒரு நாள் அவர்கள் இருவரும் சேர்ந்து செய்த சிறந்த வேலை ஒன்றைப் பற்றிய சுருக்கமான ஆக்கம் ஒன்றை செய்க.

## ක්‍රියාකාරකම 05

(අ) කතාබහත්, ලිවීමත් අතර ඇති පහත දැක්වෙන වෙනස්කම් ඉගෙන ගන්න.

உரையாடல், எழுதுதல், என்பவற்றுக்கிடையே உள்ள பின்வரும் வேறுபாடுகளை கற்றுக் கொள்ளவும்.

| ලියන බස | කතා කරන බස |
| --- | --- |
| යාළුවෝ කතා කරති. | යාළුවෝ කතා කරනවා. |
| ඔවුහු සතුටු වෙති. | ඒ අය සතුටු වෙනවා. |
| මුනිදාස දිව යයි. | මුනිදාස දුවනවා. |
| ඔහු හිඳ ගනියි. | එයා ඉඳ ගන්නවා. |
| මෙය දිනපතා සිදු වෙයි. | මේක හැම දා ම සිද්ද වෙනවා. |

(අ) පහත දැක්වෙන වාක්‍යවල වරහන් තුළ යොදා ඇති ක්‍රියා පදය ලියන බසට ගැළපෙන සේ වෙනස් කොට ලියන්න.

பின்வரும் வசனங்களின் அடைப்புக்குள் உள்ள பயனிலைச் சொற்களை எழுத்து மொழிக்கு ஏற்றவாறு மாற்றி எழுதுக.

මිනිස්සු වැඩ (කරනවා)
ළමයා පාඩම් (කරනවා)
මට කවියක් මතක් (වෙනවා)
අම්මලා පොත් මිලට (ගන්නවා)
ගුරුතුමා අපෙන් පාඩම් (ගන්නවා)